# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2019

## First Term Test - 2019

**ඉතිහාසය - I, II**
History - I, II

කාලය පැය 1 ½

7 ශ්‍රේණිය

නම :- ............................................. විභාග අංකය :-

## I පත්‍රය

- සියළු ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

* 1 – 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශ්‍රී ලාංකික පුරාණ ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වූයේ,

(i) වෙළඳාම (ii) කර්මාන්ත (iii) පතල් කර්මාන්තය (iv) කෘෂි කර්මාන්තය

(02) පළමුවන සේන රජතුමා රාජ්‍ය කරනු ලැබූ වකවානුව වූයේ,

(i) ක්‍රි.ව. 684 – 718 දීය. (ii) ක්‍රි.ව. 640 – 670 දීය.
(iii) ක්‍රි.ව. 833 – 853 දීය. (iv) ක්‍රි.ව. 853 – 887 දීය.

(03) අනුරාධපුර රාජ්‍ය සමයේ මුල්භාගයේ අපේ රටේ සිටි රජ කෙනෙකු නොවන්නේ,

(i) දේවානම් පියතිස්ස රජු (ii) විජයබාහු රජු
(iii) මහසෙන් රජු (iv) වසභ රජු

(04) අතීතයේ අපේ විදේශ වෙළඳාම යටතේ මෙරටට විදේශයෙන් ගෙන එනු නොලැබුයේ,

(i) සුවඳ විලවුන් (ii) සේද රෙදි
(iii) අශ්වයින් (iv) මැණික්

(05) IV වන උදය රජතුමා ක්‍රි.ව 946 සිට කිනම් වර්ෂය දක්වා රජකම් කළේ ද?

(i) 996 දක්වා (ii) 930 දක්වා
(iii) 954 දක්වා (iv) 964 දක්වා

(06) මින්නේරිය වැව තැනවූයේ,

(i) මහසෙන් රජුය. (ii) දුටුගැමුණු රජුය.
(iii) වසභ රජුය. (iv) දේවානම් පියතිස්ස රජුය.

(07) මානවම් රජු රට පාලනය කළේ,

(i) වසර 25 කි. (ii) වසර 18 කි.
(iii) වසර 35 කි. (iv) වසර 40 කි.

(08) අනුරාධපුර සමයේ රාජ්‍ය පාලයනයට සහාය වූ ඈපා, මාපා වැනි ඉහළ තනතුරුවලට පත් වූයේ,

(i) රජ පවුලට අයත් නැති අයයි. (ii) රජ පවුලේ කුමාරවරුයි.
(iii) සේනාපතිගේ දරුවන්ය. (iv) රජු විසින් පත් කරන අයයි.

(09) චතුරංගනී සේනාවට අයත් නොවන්නේ,

(i) ඇත් (ii) අස් (iii) පාබල (iv) සේනා

(10) "වෙද හල්" කරවනු ලැබුයේ,

(i) ධාතුසේන රජුය. (ii) බුද්ධදාස රජුය. (iii) දේවානම් පියතිස්ස රජුය. (iv) සේන රජතුමාය.

(11) දකුණු ඉන්දීය දමිළ රාජ්‍යයක් නොවන්නේ,

(i) දඹදෙණිය (ii) චෝල (iii) පාණ්ඩ්‍ය (iv) පල්ලව

(12) මහා විජයබාහු රජුගේ මව වන්නේ,

(i) විශාකා දේවියයි. (ii) අනුලා දේවියයි.

(iii) සුමිත්‍රා දේවිය. (iv) ලෝකිතා දේවිය.

(13) ගවයන්ගේ පිටේ භාණ්ඩ රැගෙනයාම හඳුන්වන්නේ,

(i) තවලම ලෙස (ii) ගැල් ගොන් ලෙස (iii) ගැල් මී වුන් ලෙස (iv) ගොයම් මැඩීම

(14) පස්ගෝ රස යන පෝෂණ ද්‍රව්‍ය වලට අයත් නොවන්නේ,

(i) කිරි (ii) මෝරු (iii) බිත්තර (iv) ගිතෙල්

(15) ක්‍රි.ව. 650 දී රජවූ කාශ්‍යප රජුගේ පුත්‍රයා කවරෙක් ද?

(i) සේන රජු (ii) විජයබා රජු (iii) මාහවම්ම රජු (iv) බුද්ධදාස රජු

(16) පියා මිය ගිය පසු කුඩා පරාක්‍රමබාහු කුමරු හැදී වැඩුනේ කා ළඟද?

(i) කිත්සිරි මේඝ රජු (ii) විජයබාහු රජු (iii) සේන රජු (iv) කාශ්‍යප රජු

(17) සත්ත්ව පාලන කටයුතු වලට යොදා නොගත් සතෙකි,

(i) ගවයා (ii) අශ්වයා (iii) කුකුළා (iv) ඌරා

(18) ගොපල්ලන් යනු,

(i) මුරකරුවන්ය. (ii) හේන්පැල්රැකි අයයි.

(iii) ගවයන් රැකබලාගත් අයයි. (iv) ගොවියන්ය.

(19) "මදහස" ලෙස හැඳින්වූයේ,

(i) මහ කන්නය (ii) මැද කන්නය (iii) යල කන්නය

(20) මඩ ගොවිතැනේ දී භාවිතා නොවන වචනයකි.

(i) ගොයම් මැඩීම (ii) ගිනියාතිකාව (iii) ගොයම්කොළය (iv) කමත

(ලකුණු 2 x 20 = 40)

## II පත්‍රය

- පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01)

(i) මඩ ගොවිතැන හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

(ii) වර්ෂයක් තුළ වී වගා කරන කන්න නම් කරන්න.

(iii) කුඹුරු වගාවට සුදුසු පරිදි පස බුරුල් කිරීමේ ක්‍රියාව හඳුන්වන්නේ කුමන නමකින් ද?

(iv) කුඹුරු ගොවිතැන් කටයුතුවලට යොදාගන්නා උපකරණ මොනවාද?

(ලකුණු 20)

(02)

(i) අතීතයේ කෘෂි කර්මාන්තයේ ප්‍රධාන අංශ නම් කරන්න.

(ii) අතීතයේ හේන් හැඳින්වීමට යොදාගත් වෙනත් නම් දෙකක් ලියන්න.

(iii) හේන් ගනිතැබීමට පෙර සතුන් පැන්නීම සඳහා කරන කෑ ගැසීම හඳුන්වන නම ලියන්න.

(iv) හැලිකටා යනු කුමක් ද?

(ලකුණු 20)

(03)

(i) අතීතයේ පැවති විදේශ වෙළඳාමේ දී විදේශ වෙළෙන්දන් සංවිධානය වී සිටි වෙළඳ ශ්‍රේණි මොනවාද?

(ii) "පූග" යනුවෙන් හඳුන්වන ලද්දේ කුමක් ද?

(iii) මානවම්ම රජු විසින් කරවූ ආගමික ගොඩනැගිලි පහක් ලියන්න.

(iv) අනුරාධපුර රාජ්‍ය සමයේ රාජ්‍ය පාලනයට සහාය වූ රාජ්‍ය නිලධාරීන් පහක් නම් කරන්න.

(ලකුණු 20)

(ලකුණු 20 x 3 = 60)